# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1780 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30/11/2024<br>පැය 1125 |

# මාධ්‍ය නිවේදනය

**01. වන අලි ප්‍රහාරයකින් පුද්ගලයෙකු මියයාමක් - පූනෑව පොලිස් වසම.**

2024.11.29 වන දින රාත්‍රී කාලයේදී පූනෑව පොලිස් වසමේ පූනෑව නාවික හමුදා කඳවුර ආසන්නයේදී වන අලි ප්‍රහාරයකට ලක්ව පුද්ගලයෙකු තුවාල ලබා වව්නියාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට පූනෑව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ මාතලාන, නිට්ටඹුව ප්‍රදේශයේ පදිංචි පූනෑව නාවික හමුදා කඳවුරට අනුයුක්තව සේවය කරන ලුතිනන් කමාන්ඩර් වරයෙකි.**

මරණකරු නාවික හමුදා කඳවුර ආසන්නයේ ඇති වෙළෙඳසැලකට ගොස් රාත්‍රී ආහාර පාර්සලයක් රැගෙන කඳවුරට එමින් සිටියදී මෙම අනතුරට මුහුණ පා ඇති බවට සිදුකරන විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘතශරීරය වව්නියාව රෝහලේ මෘතශරිරාගාරයේ තැන්පත් කර ඇත. පූනෑව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. ජළ පහරකට හසුවී ට්‍රැක්ටර් රථයක් පෙරළීම හේතුවෙන් අතුරුදහන් වූ තවත් සිසුවෙකුගේ මෘත ශරීරයක් හමුවීම - කාර්තිව් පොලිස් වසම.**

2024.11.26 වන දින සවස් කාලයේ කාර්තිව් පොලිස් වසමේදී නින්දවූර් සිට සමන්තුරය දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක් ගංවතුර හේතුවෙන් කාර්තිව් බස් නැවතුම්පොල ආසන්නයේ පිහිටි පාලම අසලින් පෙරළී අනතුරක් සිදුවී තිබුණි.

මෙහිදි, අතුරුදහන් වුවන්ගේ සිරුරු සොයා නාවික හමුදාව පොලිසිය හා ප්‍රදේශවාසින් එක්ව මෙහෙයුම් ආරම්භ කර තිබිණි. ඒ අනුව 2024.11.30 වන අද දින උදෑසන කාලයේදී අතුරුදහන් වූ තවත් සිසුවෙකුගේ මෘතශරිරයක් හමු වී ඇත.

**මරණකරු වයස අවුරුදු 16 ක් වූ සමන්තුරය, මලයාඩි ග්‍රාමම් 02 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මෘතශරීරය සමන්තුරය රෝහලේ මෘතශරීරාගාරයේ තැනපත් කර ඇත.

මෙම සිද්ධියට අදාළව මේ වන විට අතුරුදහන් වූ සිසුන් 06 දෙනෙකුගේ සිරුරු හා ට්‍රැක්ටර් රථයේ රියදුරුගේ, එහි ගමන් ගත් තවත් පුද්ගලයෙකුගේ මෘතශරීර ඇතුළු මෘත ශරීර 08 ක් හමුවී ඇත. කාර්තිව් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**